# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,527—1958 සැප්තැම්බර් 19 වැනි සිකුරාදා—19.9.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට සැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 807 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 808 | මාගී කොමිටි දැන්වීම ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම ... ... | 810 |


## පළාත් පාලන නිවේදන

### 1952 යේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

1952යේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වෙනි වගන්තිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදූව ගම් ප්‍රදේශයේ හබරාදූව ගම්සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයි පලකරනු ලැබේ.

යෝජනාව

පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදනය කරන ලද්ද වූද සැනේට් මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනා වලින් අනුමත කරන ලද බව වර්ෂ 1953 ක් වූ අගෝස්තු මස 7 වෙනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූ ද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1, 2, 3, 4, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17, 18, 19, 20, 21, 22, 23, 24, 25, 26, 27, 28, 29, 30, 31, 32, 33, 35 සහ 37 යන කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පලවන දින සිට සම්මත කර ගැනීමට හබරාදූව ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් 1952 යේ අංක 6 දරණ ප්‍රදේශාධිකාරී සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

වයි. විජයවික්‍රම,
හබරාදූව ගම්සභාවේ සභාපති.

ගම්සභා කොමිටි කාර්යාලය,
උණවටුන, 25.7.58.

---

### මැදසිය පත්තුව ගම්සභාව

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වන පරිච්ඡේදය) 13 ඒ වගන්තිය යටතේ නිකුත් කරන නියෝගයයි**

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (201 වන පරිච්ඡේදයේ) 13 ඒ දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලයේ ප්‍රකාර නිසි නිලධාරියා වූ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස් පත්තුව මැදසිය පත්තුව ගම්සභාවේ සභාපති ඊ. ජී. ප්‍රේමරත්න වන මම, 1960 ජූනි මස 30 වැනිදැයින් අවසන් වන මෙම කොමිටියේ කාලසීමාව තුළ හාරිස්පත්තුව මැදසිය පත්තුව ගම්සභාවේ ගම් ප්‍රදේශය ඇතුළත මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම මෙයින් තහනම් කරමි.

ඊ. ජී. ප්‍රේමරත්න,
සභාපති.

මැදසිය පත්තුව හාරිස් පත්තුව ගම්සභා
කාර්යාලය,
අරඹේකඩේ, වැරැල්ලගම.
1958 සැප්තැම්බර් මස 11 වැනි දින.

# අතුරු ව්‍යවස්ථා

ඇල්. ඩී.—බි 108/50

ඇල්. ජී. ඩී—ජී. අයි 11/20/ජී.

## ගම්සභා ආඥපනත

ගම්සභා ආඥපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවේ පල්ලේගම්පහ ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව විසින් සම්පාදිතව, 1947ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිත වූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති තුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ වැඩබලන ස්ථාවර ලේකම් තැන.

මෙ‍ී 1958ක්වූ සැප්තැම්බර් මස 8 වැනි දින,
කොළඹදීය.

## අතුරු ව්‍යවස්ථාව

### ජල සම්පාදනය

1. පොදු වතුර පයිප්පවලින් හෝ ජලනළවලින් හෝ පුද්ගලික වතුර පයිප්පයකින් හෝ මේ අතුරු ව්‍යවස්ථාවල නියම කර තිබෙන යම් අන්දමකින් හෝ මිස නැත්නම් කාර්‍ය සභාවේ ජලකර්මාන්තය කින් වතුර ලබාගත යුතු නැත.

2. කිසිවකු විසින් පොදු වතුර පයිප්පයකින්—

(අ) සාමාන්‍යයෙන් අතින් රැගෙන යා හැකි පනිට්ටුවකින් හෝ එබඳු භාජනයකින් හැර කරත්තයකින් හෝ පීප්පයකින් හෝ වෙනයම් භාජනයකින්, හෝ

(ආ) නාස්ති වී යා හැකි යම් ප්‍රකාරයකට හෝ ප්‍රමාණයකට හෝ වතුර ගත යුතු නැත.

3. කිසිවකු විසින් මොනම පොදු වතුර පයිප්පයකට වත් යම් බටයක්, නළයක්, රබර් නළයක්, පීල්ලක් හෝ එබඳු මොනම අන්දමේවත් උපක්‍රමයක් සම්බන්ධ නොකළ යුතුයි.

4. කිසිවකු විසින් යම් පොදු වතුර පයිප්පයකට සවිකරන ලද්දවූ හෝ එහි කොටසක් කොට ඇත්තාවූ හෝ ඉබේ ක්‍රියා කෙරෙන ඉපියාව හෝ වෙනත් එබඳු උපක්‍රමය අතපත ගෑම හෝ ඒ ඉපියාවේ හෝ උපක්‍රමයේ ඉබේ ක්‍රියා කිරීම තාවකාලික වශයෙන් හෝ සදාකාලික වශයෙන් හෝ වැළැක්විය හැකි වෙනත් යම් ක්‍රියාවක් කිරීම හෝ නොකට යුතුයි.

5. කිසිවකු විසින් ගෙදර දොරේ කටයුත්තකින් බාහිරවූ මොනම කටයුත්තකටවත් පොදු වතුර පයිප්පයකින් ජලය ලබා ගත යුතු නැත.

6. අප්‍රසන්න ස්පර්ශයෙන් බෝවෙන හෝ බෝවෙන රෝගයකින් පෙළෙන්නාවූ හෝ ලඟදී පෙලී සිටියාවූ හෝ එබඳු රෝගයකින් පෙළෙන කෙනෙකුට ළඟදී සාත්තු කිරීමේ යෙදී සිටියාවූ කිසිවකු විසින් පොදු වතුර පයිප්පයකින් වතුර ගත යුතු නැත.

7. කිසිවකු විසින් එවකට කාර්‍ය සභාව කෙරෙහි පවරා ඇත්තාවූ හෝ කාර්‍ය සභාවෙන් නඩත්තු කරනු ලබන්නාවූ හෝ යම් ජලාශයක, වතුර පයිප්පයක, දිය උල්පතක, ජල භාජනයක, ජල නළයක හෝ වෙනත් ජලකර්මාන්තයක හෝ ඒ අසල නෑම හෝ තම ශරීරයෙන් යම් කොටසක් සේදීම හෝ යම් සතකු හෝ රථවාහනයක් හෝ රෙදි පිළි හෝ උපකරණ හෝ වෙනත් මොන අන්දමේ වූවද ද්‍රව්‍ය සේදීම හෝ නොකට යුතුයි.

### පුද්ගලික ජලනළ සවිකිරීම සම්බන්ධයෙන් වූ ආවශ්‍යකතා

8. මීට යාකොට ඇති උප ලේඛනයේ දක්වෙන "ඒ" පෝර්මයේ ප්‍රකාරයට ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් පිට ප්‍රධාන තුමාගෙන් ලියවිල්ලකින් වූ අනුමතියක් කලින් ලබා නොගෙන කිසිවකු විසින්—

(අ) යම් පුද්ගලික දේපලකට කාර්‍ය සභාවේ ප්‍රධාන ජලමාර්ගයකින් හෝ කර්මාන්තයකින් අලුත් ජල සේවයක් හෝ අලුත් යම් වතුර පයිප්පයක් පිහිටවීම හෝ ඒ සඳහා යම් කර්මාන්තයක් පටන් ගැනීම, හෝ

(ආ) කාර්‍ය සභාවේ ප්‍රධාන ජල මාර්ගයකට හෝ ජල කර්මාන්තයකට සම්බන්ධකොට තිබෙන යම් වතුර පයිප්ප වෙනස් කිරීම, දික් කිරීම, ශුද්ධ පවිත්‍ර කිරීම හෝ අලුත් කිරීම හෝ එබඳු යම් කටයුත්තක් සඳහා යම් වැඩක් පටන් ගැනීම හෝ නොකට යුතුයි.

9. 7 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රධාන තුමා විසින් අනුමත කරනලද යම් කර්මාන්තයක් කරගෙන යා යුත්තේ ප්‍රධානතුමා විසින් ලියවිල්ලකින් දෙනු ලබන උපදේශවල ප්‍රකාරයටය. එතුමා විසින් අනුමත නොකරන ලද කිසිම උපකරණයක් හෝ කොටසක් ඒ කර්මාන්තය සඳහා පාවිච්චි නොකළ යුතුයි.

10. කාර්‍ය සභාව විසින් එකම දේපලක් කොට තක්සේරු කරන ලද්දවූ ද එකම භූමිභාගයෙහි පිහිටියාවූ ද යම් දේපලකට වතුර ලබා ගැනීම සඳහා කාර්‍ය සභාවේ ප්‍රධාන ජල මාර්ගයකට හෝ ජල කර්මාන්තයකට එක පයිප්ප මාර්ගයකට වඩා සම්බන්ධ කළයුතු නැත.

11. පුද්ගලික ජල සම්පාදනයක් සඳහා පාවිච්චි කරන සියලුම පයිප්ප එක්කෝ ගල් තාර බදු සංයෝගයකින් ආවරණය කරන ලද "කාස්ට් අයන්" නම් වාත්තු කළ යකඩ වලින් හෝ එසේ නැත්නම් තුත්තනාගම් ද තිබෙන යකඩවලින් හෝ සෑදී තිබිය යුතුයි. තවද ඒ පයිප්පවල මහත ප්‍රමාණය හා තත්ත්වය ප්‍රධාන තුමා විසින් අනුමත කරන ලද ප්‍රකාරයට විය යුතුයි.

12. මේ අතුරු ව්‍යවස්ථා බලපැවැත්වෙන දිනට පසු—

(අ) කාර්‍ය සභාවේ ජල කර්මාන්තයෙන් ගෙදර දොරේ කටයුතු සඳහා සැපයෙන වතුරවලින් ගැලොම් 10යකට වැඩි ප්‍රමාණයක් අල්ලන ජලාසයක් හෝ ජලාස යම් දේපලක පිහිටවීම හෝ සෑදීම නොකටයුතුයි.

(ආ) ඒ කර්මාන්තවලින් සැපයෙන වතුර රැස් කිරීමට කිසිම ජලාසයක්, ජලාස හෝ නාන බාල්දියක් ඒවායේ ප්‍රමාණය සැලැස්මවල් හා ගණන පිළිබඳව ප්‍රධාන තුමාගේ අනුමතිය කලින් ලැබී තිබෙනොත් මිස නැත්නම් කිසිම දේපලක පිහිටුවීම හෝ සෑදීම හෝ නොකළ යුතුයි.

13. යම් දේපලකට වතුර ලබා ගැනීමට සවිකොට තිබෙන පයිප්ප, ජලාසය, හෝ වෙනත් උපකරණ වෙනයම් දේපලක පිහිටි පයිප්පයකට හෝ උපකරණයකට සම්බන්ධ කළයුතු නැත.

14. ප්‍රධාන තුමාගේ විශේෂ අවසරය නැතුව පුද්ගලික ජල සේවයක කොටසක් කොට ඇති කිසිම පයිප්පයක් කිසිම "බොයිලරයකට" උණුකරන යන්ත්‍රයකට හෝ වෙනයම් යන්ත්‍ර සූත්‍රාදියකට එක එල්ලේම සම්බන්ධ නොකළ යුතුයි.

15. ප්‍රධානතුමා විසින් හෝ එතුමාගෙන් ඒ සඳහා බලයලත් යම් නිලධාරියෙකු හෝ යම් අයෙකු විසින් පරීක්ෂා කරනු ලැබ අනුමතකරනු ලබනතුරු යම් දේපලකට වතුරදීම සඳහා අලුතෙන් සාදන ලද පයිප්ප ක්‍රමයට පයිප්ප, ඉපියාවල්, කරාම හෝ වෙනත් දේවල් ආවරණය කළයුතු නැත.

16. (1) 15 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ අලුතෙන් සාදන ලද ජල සැපයීමේ සේවයක් පරීක්ෂා කරනු ලැබ අනුමත කර තිබෙනවිට ඉල්ලුම් කරුවා විසින්—

(ඒ) ප්‍රධානතුමා විසින් තක්සේරු කරන ලද ප්‍රකාර කාර්‍ය සභාවේ ප්‍රධාන ජලමාර්ගවලට හෝ ජලකර්මාන්ත වලට ඒ සේවය සම්බන්ධකිරීමට යන වියදම සහ ඒ පිළිබඳව කම්කරුවන්, උපකරණ හා පරිපාලනය සඳහා යන වියදමත්,

(බී) පයිප්ප සම්බන්ධ කිරීම හා ජලය සැපයීම සඳහා රුපියල් 20යක වාර මුදලක් නොහොත් අතිරේක ගාස්තුවක්,

කාර්‍ය සභාවේ තැන්පත් කළ යුතුයි.

(2) මේ අතුරු ව්‍යවස්ථාවේ 1 වැනි ඡේදය යටතේ තැන්පත් කළ යුතුවූ ගාස්තුව විධිවූ ප්‍රකාර ගෙවන තුරු පයිප්ප මාර්ගය සම්බන්ධ කළ යුතු නැත.

17. ප්‍රධානතුමා විසින් බලය පවරන ලද කාර්‍ය සභාවේ නිලධාරියෙකුගේ පාලනය යටතේ මිස නැත්නම් යම් පුද්ගලික දේපලකට ජලය සැපයීමට පිහිටුවන ලද පයිප්ප කාර්‍ය සභාවේ ප්‍රධාන ජලමාර්ග වලට හෝ අප්‍රධාන ජල මාර්ගවලට සම්බන්ධ නොකළ යුතුයි.

### අපතේ යාම වැළැක්වීම

18. (1) කාර්‍ය සභාවේ ජලකර්මාන්තවලට සම්බන්ධවූ යම් දේපලක පිහිටි පුද්ගලික ජල සම්පාදන ක්‍රමයක කොටසක් කොට ඇති යම් පයිප්පයක, කරාමයක, ඉපියාවක හෝ වෙනත් කොටසක පිළිවෙළ, ප්‍රමාණය, පිහිටීම, ස්වභාව හෝ තත්ත්වය යන මෙයින් පොදු ප්‍රයෝජනය හෝ පුද්ගලික ප්‍රයෝජනය සඳහා ජල කර්මාන්තයන් සැපයෙන වතුර අපතේ යාම, වැරදි ලෙස පාවිච්චි කිරීම, ක්‍රම විරෝධී ලෙස පරිහරණය කිරීම හෝ නරක්වීම ඇතිවිය හැකිය කියා හෝ ජල කර්මාන්තයෙන් සැපයෙන වතුර විධිවූ පරිදි පාලනය කිරීම හෝ බෙදා හැරීම සම්බන්ධයෙන් අගතියක් සිද්ධවිය හැකිය කියා හෝ විශ්වාස කිරීමට තරම් හේතු සාධක තිබෙන කවර විටකදී වුවත් ප්‍රධානතුමා විසින් ඒ දේපලේ අයිතිකාරයා වෙත මීට යාකොට ඇති උප ලේඛනයේ "බී" පෝර්මයේ ප්‍රකාර දැන්වීමක් භාරදිය හැකිය.

(2) එබඳු සෑම දැන්වීමකම ප්‍රධාන තුමා අවශ්‍යයයි අපේක්ෂා කරන වෙනස් කිරීම සඳහන් කර තිබිය යුතුමිසත් හැර ඒ දැන්වීමේ සඳහන් කර තිබෙන කාලසීමාව ඇතුළතදී ඒ අයිතිකාරයා විසින් ප්‍රධාන තුමා සන්තර්පනය වන පරිද්දෙන් ඒ දේවල් වෙනස් කළ යුතුයි.

(3) අයිතිකාරයාගේ පදිංචිය හෝ නාමය නොදන්නා විට ඊට අදාල දේපලේ කාටත් පෙනෙන ස්ථානයක අලවා තිබෙන විට ඒ දැන්වීම ඒ අයිතිකාරයාට මිඹිවූ පරිදි භාර දුන්නාක් මෙන් සැලකිය යුතුයි.

19. ප්‍රධාන තුමා විසින් :—

(ඒ) යම් දේපලක අයිතිකාරයාගේ හෝ පදිංචිකාරයාගේ ඉල්ලීම පිට, හෝ

(බී) ඒ දේපලේ අයිතිකාරයා විසින් හෝ පදිංචිකාරයා විසින් මේ අතුරු ව්‍යවස්ථාවල විධි විධානවලට එකඟව යම් ජලසම්පාදන ක්‍රමයක් සෑදීම හෝ පයිප්ප දැමීම සම්බන්ධයෙන් යම් යම් දේ ඉෂ්ට නොකර හෝ වෙනස් නොකර තිබේ නම්,

(සී) ජල කර්මාන්ත අපිරිසිදු කිරීම හෝ ඒවාට හානි කිරීම හෝ වතුර අපතේ නාස්තිකර දැමීම හෝ වැරදි ලෙස පාවිච්චි කිරීම සම්බන්ධයෙන් වූ මේ අතුරු ව්‍යවස්ථාවල විධි විධාන වලට විරුඬව යම් ක්‍රියාවක් හෝ දෙයක් ඒ දේපොල අයිති කාරයා විසින් හෝ පදිංචිකාරයා විසින් කරන ලදුව හෝ ඒ විධානවලට එකඟවන පරිද්දෙන් යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම මගහරින ලදුව හෝ තිබේ නම් එවිට ; හෝ

කාර්‍ය සභාවේ ප්‍රධාන ජල මාර්ගවලින් හෝ ජල කර්මාන්ත වලින් ඒ දේපලට දමා තිබෙන පුද්ගලික ජල සම්පාදනය සඳහාවූ පයිප්ප අසම්බන්ධ කිරීම හෝ ඒ දේපලට ජලය සැපයීම අත්හිටවීම කලකට නැවැත්වීම හෝ අඩු කිරීම කටයුතුයි.

20. කාර්‍ය සභාවේ ජල කර්මාන්තවලින් පුද්ගලික ජල සේවයක් සම්බන්ධ කොට ඇති ගෙයක හෝ දේපලක පදිංචිකාරයා විසින් ඒ සේවයේ කොටසක් කොට ඇති යම් පයිප්පයකින්, කරාමයකින් හෝ වෙනත් උපක්‍රමයකින් වතුර අපතේ යන කවර විටකදී වුවත් වහාම ඒ බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි. එකී ගෙයි හෝ දේපලේ පදිංචිකරු පිළිබඳව වෙනසක් සිදුවූ කවර විටකදී වුවත් ඒ වෙනස සිදුවූ වේලාවේ සිට පැය හතළිස් අටක් ඇතුලතදී අලුතෙන් එන පදිංචි කරුවා විසින් ඒ බව ප්‍රධාන තුමාට දැනුම් දිය යුතුයි.

21. යම් දේපලක පිහිටි පුද්ගලික ජල සේවයක කොටසක් කොට ඇති යම් කරාමයකින්, පයිප්පයකින් හෝ වෙනත් උපක්‍රමයකින් වතුර අපතේ යනවා පෙනෙන්ට තිබෙන කවර විටකදී වුවත් ප්‍රධාන තුමා විසින් හෝ එතුමා විසින් ඒ සඳහා බලය පවරන ලද යම් කෙනෙකු විසින් වහාම ඒ සේවය කාර්‍ය සභාවේ ප්‍රධාන ජල කර්මාන්ත වලින් වෙන් කළ හැකිය. ඒ දේපලේ අයිතිකරුවා විසින් හෝ පදිංචි කරුවා විසින් හෝ ඒ අපතේ යාමට හේතුව ඉවත් කරන තුරු එකී සේවය නැවත සම්බන්ධ නොකළ යුතුයි.

22. 18 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් උඩ කපා හරින ලද යම් පුද්ගලික ජල සේවයක් කාර්‍ය සභාවේ ප්‍රධාන ජල මාර්ගයට හෝ ජල මාර්ගවලට සම්බන්ධ කිරීමට ප්‍රධානතුමා විසින් ගණන් බලන ලද වියදම ඒ දේපලේ අයිතිකාරයා විසින් කාර්‍ය සභාවට කලින් ගෙවිය යුතුයි. එයින් යම් මුදලක් ඉතුරු උනොත් වැඩ අවසාන වූවාට පසු ඒ මුදල ඔහුට ආපසු දෙනු ලැබේ. ඇත්ත වශයෙන් වියදම් වූ මුදල ගණන් බලන ලද වියදමට වඩා වැඩි උනොත් ඒ වැඩේ අවසන් වූ වහාම අයිතිකාරයා විසින් ඒ වැඩිය වියදම්වූ ගණන ගෙවිය යුතුයි.

23. (ඒ) ජල කර්මාන්තයේ වතුර ප්‍රමාණවත් නොවේය කියා, හෝ

(බී) ප්‍රධාන ජල මාර්ග හෝ ජලකර්මාන්ත විශාල කිරීම, වෙනස් කිරීම හෝ අලුත් වැඩියා කිරීම සඳහා හෝ ප්‍රධාන ජල මාර්ගවලට පයිප්ප සම්බන්ධ කිරීම සඳහා හෝ එසේ කිරීම ආවශ්‍යකය නැතහොත් ප්‍රයෝජනය කියා, හෝ

(සී) පොදු වතුර පයිප්පයකට සිදුවූ යම් අලාභයක් නිසා හෝ එහි වතුර අපවිත්‍ර වීම හෝ අපතේ යාම නිසා එසේ කිරීම ආවශ්‍යකය නැතහොත් ප්‍රයෝජනය කියා, හෝ

(ඩී) ගින්නක් පැන නැගීමෙන් ජල කර්මාන්තයට යම් අලාභයක් සිදුවී තිබේය නැතහොත් සිදුවෙන්ට ඉඩ තිබේය කියා, හෝ ඒත්තු ගිය කවර විටකදී වුවත් ප්‍රධාන තුමා විසින් ආඥා පණත යටතේ හෝ මේ අතුරු ව්‍යවස්ථා යටතේ හෝ අය වෙන්නට තිබෙන හෝ අයවිය යුතුව තිබිය හැකිවූ යම් වතුර බද්දක් හෝ වෙනත් මුදල් ආදියක් සම්බන්ධයෙන් කිසිම අවාසියක් නැතුව කාර්‍ය සභාවේ ජල කර්මාන්තවලට සම් බන්ධවූ යම් ප්‍රධාන ජල මාර්ගයකින්, පොදු උල්පතකින්, පයිප්පයකින් හෝ වෙනත් උපකරණයකින් ජලය සැපයීම සම්පූර්ණයෙන්ම හෝ අඩුවශයෙන් හෝ අත් හිටවීම, අඩු කිරීම හෝ වෙන අතකට හැරවීම හෝ කළ හැකිය.

24. එක් එක් පුද්ගලික සේවයේ කරාමය හෙවත් ඉපියාවත් ඒ කරාමයේ නොහොත් ඉපියාවේ සිට ප්‍රධාන ජල මාර්ගය දක්වාවූ වතුර ලබාගන්නා පයිප්පයේ කොටසක් කාර්‍ය සභාව සතු දේපලක් වශයෙන් සැලකිය යුතුයි. ඒ කොටස නඩත්තු කිරීම, අලුත් වැඩියා කිරීම, හෝ එහි අලුත් කෑලි දැමීම සඳහා වූ වියදම කාර්‍ය සභාවෙන් දැරිය යුතුයි. ඒ කොයිනෑම් වෙනත් යම් අලුත් වැඩියා කිරීමක් නොහොත් අලුතෙන් කෑලි දැමීමක් අවශ්‍ය වන්නේ ඒ සේවය සපයා ඇති දේපලේ අයිති කාරයා හෝ පදිංචිකාරයා විසින් ඕනෑකමින් කරන ලද යම් ක්‍රියාවකින් හෝ පැහැර හැරීමකින් සිදුවූ යම් හානියක් හේතු කොටගෙන නම් එසේ අලුත් වැඩියා කිරීම හෝ අලුතෙන් කෑලි දැමීම සඳහා යන වියදම එකී අයිතිකාරයා විසින් කාර්‍ය සභාවට ගෙවිය යුතුය කියා ප්‍රධාන තුමා විසින් ඉල්ලා සිටි විට ඒ අයිතිකාරයා විසින් ඒ මුදල කාර්‍ය සභාවට ගෙවිය යුතුයි.

25. 15 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් පුද්ගලික සේවයක් හෝ පයිප්ප සවිකිරීමක් අනුමතකර තිබීම හෝ ඒ පුද්ගලික සේවය පිහිටි ඉඩමේ අයිතිකාරයාට හෝ පදිංචිකාරයාට මේ අතුරු ව්‍යවස්ථා වලින් යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ යම් අවසරයක් හෝ සහතයක් දී තිබීම හේතු කොටගෙන පයිප්පයේ යම් කොටසක් පිපිරී යාමෙන් හෝ පයිප්පයේ යම් කොටසකින් නොහොත් ඊට සවිකරන ලද දෙයකින් වතුර පිටාරේ යාමෙන් හෝ සිදුවන යම් අලාභයක් ගැන මොනම කාරණයක් සම්බන්ධයෙන් වුවද කාර්‍ය සභාව කෙරෙහි යම් වගකීමක් පැවරී තිබේයයි සැලකිය යුතු නොවේ.

26. කොන්ත්‍රාත්තුවක්, ඔප්පුවක් හෝ ගිවිසුමක් පිට හෝ එසේ නැතුව හෝ කාර්‍යසභාවෙන් ජලය සපයාගෙන යනවිට බලාපොරොත්තු නොවූ නියඟයක් නිසා හෝ යම් කර්මාන්තයක් කරගෙන යාමේදී තාවකාලික වශයෙන් ජලය සැපයීම අත්හිටවීම නිසා හෝ වැලැක්විය නොහැකි වෙනත් යම්කාරණාවක් හෝ අනතුරක් නිසා හෝ එසේ කිරීමට බැරිවුනොත් ඒ ගැන අලාභ ගෙවීමට කාර්‍ය සභාව බැඳී නැත.

27. (1) ජල කර්මාන්තවලට සම්බන්ධවූ පුද්ගලික ජල සේවයක් සපයා ඇති ඕනෑම ඉඩමක පදිංචිකාරයා වෙත පැයකට නොඅඩු කාල සීමාවකට කලින් දැනුම්දී ප්‍රධාන තුමා විසින් හෝ ඒ සඳහා එතුමා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද වෙනත් යම් නිලධාරියෙකු විසින් ඒ සේවය සම්බන්ධයෙන් වූ පයිප්ප කර්මාන්ත හා සවිකරපු දේවල් යන මේවායේ ස්වභාවය පරීක්ෂා කිරීම පිණිසත් ඒ සේවයෙන් සැපයෙන ජලය අපතේ යනවාද කියා නිශ්චය කර ගැනීම පිණිසත් ඉර පෑයීම හා ඉර බැසීම අතර වූ ඕනෑම වේලාවක එකී දේපලට ඇතුල් විය හැකිය.

(2) යම් කාරණයක් නිසා එකී දැන්වීම ඒ දේපලේ පදිංචිකාරයාට පුද්ගලික වශයෙන් දෙන්ට හෝ භාර දෙන්ට නුපුළුවන් වූ විට ඒ දේපලේ කාටත් පෙනෙන තැනක ඒ දැන්වීම අලවා තැබීම මේ අතුරු ව්‍යවස්ථාව සඳහා ප්‍රමාණවත් වන්නේ ය.

(3) කාර්‍ය සභාව මගින් පවත්වාගෙන යන ජලය සැපයීමේ ව්‍යාපාර යෙන් යම් දේපලකට පුද්ගලික ජලනලයක් සම්බන්ධ කර තිබෙන විට එකී දේපල අයිතිකාරයා හෝ පදිංචිකාරයා වෙත දැන්වීමක් භාර කර එම දේපලේ සවිකර තිබෙන එක් එක් කරාමයක් වෙනුවෙන් රුපියල් 2.50ක් සෑම මාසයකම එකී ජලය සැපයීමේ ව්‍යාපාරයෙන් ලබා ගත් ජලය වෙනුවෙන් ගෙවිය යුතුය.

28. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ කාර්‍ය සභාවට ගෙවිය යුතු මුදල් ප්‍රධාන තුමාට හෝ එකී මුදල් භාර ගැනීමට බලය දෙන ලද කාර්‍ය සභාවේ නිලධාරියාට කාර්‍ය සභා කාර්‍යාලයේදී ගෙවිය යුතුවන්නේය.

29. 1946ක් වූ නොවැම්බර මස 29වෙනි දින අංක 9,637 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිඬ කරන ලද අතුරු ව්‍යවස්ථා එහි 11 (1) වැනි අතුරු ව්‍යවස්ථා එක්කම ඊ ලඟට පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථා යෙදීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11 (1) (ඒ) ප්‍රධාන තුමා විසින් ඒ සඳහා නිකුත් කරන ලද විශේෂ බලපත්‍රයකින් ලත් අවසරයක් පිට මිස නැත්නම් කිසිවෙකු විසින් ආගමික උත්සවයක් පවත්නා කාලය තුළ කිසිම බත් කඩයක් හෝ රෙස්ටෝරන්ට් ශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම යුතු නැත.

11 (1) (බී) 11 (1) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ බල පත්‍රයක් දරන්නෙකු සම්බන්ධයෙන් අදාල වන පරිද්දෙන්ම 11 (1) (ඒ) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද බල පත්‍රයක් දරන්නෙකු සම්බන්ධයෙන්ද 13 සිට 19 වැනි අතුරු ව්‍යවස්ථාවල විධි විධාන අදාල වේ.

**වචනාර්ථ නිරූපනය**

30. මේ අතුරු ව්‍යවස්ථාවල—

" ප්‍රධාන තුමා " යනුවෙන් කාර්‍ය සභාවේ ප්‍රධාන තුමා අදහස් කරනු ලැබේ ;

" කාර්‍යසභාව " යනුවෙන් ගම්ප්‍රදේශයේ ගම්කාර්‍ය සභාව අදහස් කරනු ලැබේ ;

" ආඥාපනත " යනුවෙන් ගම්සභා ආඥාපනත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ ;

" ගම්ප්‍රදේශය " යනුවෙන් හාරිස්පත්තුවේ පල්ලේගම්පහ ගම් ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

## " ඒ " ෆෝරමය

"8" වැනි අතුරු ව්‍යවස්ථාව

අංකුඹුර—මීගහ මඩින්න (හා.ප.) පල්ලේ ගම්පහ ගම්සභා සභා කාර්යාලය

ජලකර්මාන්ත දෙපාර්තමේන්තුව

දිනය :———.

අංකය :———.

අංකය :———.

හාරිස්පත්තුවේ පල්ලේ ගම්පහ ගම්සභාවේ ප්‍රධාන තුමා වෙතටයි.

මීට යකොට ඇති උපලේඛනයෙහි සඳහන් ප්‍රකාරයට——— කොට්ඨාශයේ අංකය———දරණ වීථියේ අංකය——— දරණ ගෙය සඳහා පුද්ගලික ජල සේවයක්

* තැනීමට,

* වෙනස් කිරීමට,

* දීර්ඝ කිරීමට, හෝ

* ශුඩ පවිත්‍ර කිරීමට.

තමුන්නාන්සේගේ අනුමතිය ලියවිල්ලකින් දෙන මෙන් මෙයින් ඉල්ලුම් කර සිටිමි.

ජලය උවමනාවී තිබෙන්නේ ගෙදර කටයුතු සඳහාද, එසේ නැත්නම් වෙනත් කටයුත්තක් සඳහාද යන වග :———.

දේපල පාවිච්චිකරන්නේ කුමන කටයුත්තකටද යන වග :———

තැන්පත් කරන ලද මුදල :———.

ඉහතින් සඳහන් කරන ලද උපලේඛනය.

| පුද්ගලික දේපලවල සවිකරනලද පයිප්ප | කරාම | ජල ටැන්කි |
|---|---|---|

| දිග ප්‍රමාණය ගණන | පිහිටීම ප්‍රමාණය | වතුර අල්ලන ප්‍රමාණය | පිහිටීම |
|---|---|---|---|
| | | | |

වෙනත් කරුණු :———.

(කරුණාකර පැහැදිලිව ලියනු මැනවි)

අයිතිකාරයාගේ අත්සන :———.

අයිතිකාරයාගේ නම :———.

අයිතිකාරයාගේ ලිපිනය :———.

පදිංචිකාරයාගේ අත්සන :———.

පදිංචිකාරයාගේ නම :———.

පදිංචිකාරයාගේ ලිපිනය :———.

———
ඉල්ලුම් කරු.

* උවමනා නැති වචන කපා දමනු.

## " බී " ෆෝරමය

18 වැනි අතුරු ව්‍යවස්ථාව

**පළුදුවී තිබෙන සේවයක් වෙනස් කිරීමට කරන දැන්වීම**

හාරිස්පත්තුවේ පල්ලේ ගම්පහ ගම්සභා සභා කාර්යාලය.

වෙලේකඩේ,

අඹතැන්න.

දිනය :———.

දිනය :———.

———වීථියේ අංක———දරණ මෙගයි අයිතිකාරයා වෙතටයි.

ඉහත සඳහන් දේපලට සවිකර තිබෙන වතුර පයිප්ප පරීක්ෂාකර බලන ලදුව ඒවායේ යම් යම් දෝස දක්නට තිබෙන බැවින් ඒවාට මෙහි පහත සඳහන් වෙනස් කිරීම් හෝ අලුත් වැඩියා කිරීම් අවශ්‍ය බැව් සහතික කරමි. ඒවා ගැළපෙ පරිදි සම්පූර්ණ කරන මෙන් තමුන්නාන්සේට මෙයින් දැනුම් දෙමි.

මේ නිවේදනය ලැබී දවස්———ක් ඇතුලත මා තෘප්තිමත්වන පරිදි එකී වෙනස් කිරීම් හා අලුත් වැඩියාවල් නොකලහොත් තමුන්නාන්සේගේ දේපොලට සවිකර තිබෙන පයිප්ප ජල කර්මාන්තයෙන් ඉවත් කරනු ලැබේ.

මා සතුටුවන පරිදි ඒ නළමාර්ගය අලුතෙන් දමන තුරු වෙනස් කරන තුරු හෝ අලුත් වැඩියා කරන තුරු එය ජල කර්මාන්තයට නැවත සම්බන්ධ කරනු නොලැබේ.

හාරිස් පත්තුවේ පල්ලේ ගම්පහ ගම්ප්‍රදේශයේ ගම්සභා සභාවේ ප්‍රධාන තුමා.

ඇල්. ඩී.—ඩී 81/46/ඇල්. ජී. ඩී.—ජී ඒ 15/14/6.

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ නුවරඑලිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම් ප්‍රදේශයේ ගම්සභා සභාව විසින් සම්පාදිත 947තේ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළ වූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම් තැන.

වර්ෂ 1958ක්වූ සැප්තැම්බර් මස 5 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

**ඇවිද වෙළඳාම් කරන්නෝ**

1. (1) උඩපළාත ගම්සභා සභාවේ ප්‍රධාන තුමා විසින් ඒ සඳහා නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් නොමැතිව කිසිවෙකු විසින් ඇවිද වෙළඳාම් කරන්නෙකු වශයෙන් වෙළඳාමක් ආරම්භ කිරීම හෝ කරගෙනයාම නොකට යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ නිකුත් කරනලද සෑම අවසර පත්‍රයක්ම එය නිකුත් කරනලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වෙනි දිනට අවසාන වන්නේය.

# විවිධ දැන්වීම්

## අටුළුගම් කෝරළේ ගම්සභා සභාව—දෙහිඕවිට

**මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත**

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1959 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුඩව අටුළුගම් කෝරළේ ගම්සභා සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුඛ වන්නේ අසවල් කරුණ සඳහායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින යේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිත වූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

මා. ග. ජයවර්ධන,
අටුළුගම් කෝරළේ ගම්සභා සභාවේ
ප්‍රධාන තැන.

ගම්සභා සභා කාර්යාලය,
දෙහිඕවිට, 1958.9.8 වැනි දින දීය.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇස්. ඇල්. ඇම්. සමීන් ලෙබ්බෙ, ගරාගොඩ, යටියන්තොට ... | අංක. 86, ගරාගොඩ... | හරක්මස් |
| 2. ඉසඩ්. ඇම්. ඇම්. ෂරීෆ් ඩීන්, විලේගොඩ, ඇහැලියගොඩ | අංක. 67, ගරාගොඩ... | හරක්මස් |

## මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස 1958 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුඩව කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැල්ලව ගම්සභා සභා ප්‍රදේශය ඇතුලත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුන නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට 14 දිනක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත යටතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරන 1947තේ අංක 44 දරන ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරන ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඇන්. ඇම්. වාහිදු ... | ඇලගාව වත්ත හදිර වලාන, වැල්ලව ... | හරක්මස් |

ඩී. බී. හේරත්,
ගම්සභාපති තැන,
වැල්ලව ගම්සභා සභාව.

මරළුවාව,
කුරුණෑගල, 9.9.58.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.